ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Statement No: HRC/S/i/S/12/02/26

**ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ සිදු වූ විරෝධතාවය පිළිබඳ ප්‍රකාශනය**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පරිශ්‍රය තුළ කොමිෂන් සභාවේ නිලධාරිනියක විසින් සිදු කරන ලද විරෝධතාවය සම්බන්ධව කරුණු පැහැදිලි කිරීම සඳහා කොමිෂන් සභාව විසින් මෙම ප්‍රකාශනය නිකුත් කරනු ලබයි. මෙම විරෝධතාවය මෙම නිලධාරිනිය විසින් කරන ලද දෙවන විරෝධතාවය වන අතර, පළමු විරෝධතාව 2025 දෙසැම්බර් 10 වන දින පැවැත්විය.

සාමාන්‍ය තත්ත්වයන් යටතේ, කොමිෂන් සභාව තමන්ගේ නිලධාරීන්ට අදාළ අභ්‍යන්තර පරිපාලන කරුණු පිළිබඳ ප්‍රකාශන නිකුත් කිරීම සුදුසු නොවන බැවින් එවැනි ප්‍රකාශන නිකුත් කිරීමෙන් වැළකී සිටී. කෙසේ වෙතත්, මෙම සිදුවීමේ කරුණු විශේෂිත බැවින්, මහජනතාවට කොමිෂන් සභාවේ ක්‍රියාමාර්ග සහ තීරණ පිළිබඳව නිවැරදිව දැනුම්වත් කිරීම අවශ්‍ය බව පෙනී ගිය බැවින් මෙම ප්‍රකාශනය නිකුත් කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී. මෙම විරෝධතාවය මෙන්ම, මෙම නිලධාරිනිය විසින් මීට පෙර අවස්ථාවේදී කරන ලද විරෝධතාවය පිළිබඳව ද බොහෝ මාධ්‍ය ප්‍රකාශන පළකර ඇතත් ඒ සම්බන්ධව කොමිෂන් සභාවෙන් අදහස් ලබා ගැනීමක් සිදු කර නොමැති වීමත් මත මෙම ප්‍රකාශනය නිකුත් කිරීමේ අවශ්‍යතාව තවදුරටත් මතු වී ඇත.

විරෝධතාවය සිදු කරන ලද නිලධාරිනිය 2023 වසරේදී සහකාර අධ්‍යක්ෂක තනතුර සඳහා අයැදුම් කර එම තනතුරට උසස් වීමක් නොලැබීම පිළිබඳ නොසැහීමට පත් වී ඇති බව කොමිෂන් සභාව ප්‍රකාශ කර සිටී. බඳවා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර සම්මුඛ පරීක්ෂණයේදී වැඩිම ලකුණු ලබා ගත් අයැදුම්කරුවන් එම තනතුරට පත් කර ඇත. කොමිෂන් සභාවේ බඳවා ගැනීම් සම්බන්ධ තීරණයකට අභියෝග කිරීමට කාර්ය මණ්ඩල නිලධාරීන් හට අධිකරණ ක්‍රියාමාර්ග ඇතුළුව ගත හැකි විවිධ ක්‍රියාමාර්ග පවතී. මෙම නිලධාරිනිය එවැනි ක්‍රියාමාර්ග නොගෙන අදාළ තනතුර සම්බන්ධව මතය ප්‍රකාශ කිරීමට විරෝධතා ක්‍රියා දියත් කිරීමට උත්සහ කරමින් සිටි.

මෙම නිලධාරිනිය මුල් අවස්ථාවේ කොමිෂන් සභාවේ පැමිණිලි සහ විමර්ශන අංශයට අනුයුක්තව සේවය කළ නිලධාරිනියකි. අනෙකුත් නිලධාරීන් සමඟ ඇති වූ මත ගැටුම් හේතුවෙන් ඇයගේ ඉල්ලීම මත ඇය පර්යේෂණ හා අධීක්ෂණ අංශය වෙත මාරු කරන ලදී. එහි සේවය කරන අතරතුරදී ද ඇති වූ මත ගැටුම්

හේතුවෙන් ඇය වෙත රාජකාරී නොපවරන ලද බවට එම නිලධාරිනිය චෝදනා පළ කර ඇත. එම නිලධාරිනිය පරිපාලන අංශයට මාරු කිරීමට ඇති හැකියාව පිළිබඳව කොමිෂන් සභාව සාකච්ඡා කරමින් සිටි අතරතුර ඇය ජනාධිපති කාර්යාලය සහ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය ඇතුළුව තවත් ආයතන වෙත කොමිෂන් සභාවට සහ ඇතැම් නම් කර ඇති කාර්ය මණ්ඩල නිලධාරීන්ට එරෙහිව විවිධ චෝදනා එල්ල කරමින් සහ ඇයට උසස්වීම නොලැබීම පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කරන ලදී. එසේම අනෙකුත් කාර්ය මණ්ඩල නිලධාරීන් විසින්ද මෙම නිලධාරිනියට එරෙහිවද විවිධ චෝදනා ඉදිරිපත් කරන ලදී. ඉන් අනතුරුව මෙම තත්ත්වය තුළ කොමිෂන් සභාව එම නිලධාරිනිය පරිපාලන අංශය වෙත මාරු කිරීමටත් එම නිලධාරිනිය විසින් සිදු කරන ලද චෝදනා මෙන්ම ඇයට එරෙහිව ඉදිරිපත් වී ඇති චෝදනා පිළිබඳවද විමර්ශනය කිරීමට ස්වාධීන කමිටුවක් පත් කරන ලෙසට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කිරීමටත් කොමිෂන් සභාව තීරණය කළේය.

2025 දෙසැම්බර් 10 වන දින අදාළ නිලධාරිනිය පළමු විරෝධතාවය සිදු කරන අවස්ථාව වන විට කොමිෂන් සභාවේ මෙම තීරණය එම නිලධාරිනියට වාචිකව දැනුම් දී තිබුණි. එවැනි වාචික දැනුම් දීමක් කර තිබියදී සහ රට ආපදාවකට මුහුණපා සිටි අවස්ථාවකදී එම නිලධාරිනිය කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට මාධ්‍ය සංදර්ශනයක් ඇති කිරීමේ අරමුණින්ම විරෝධතාවයක් සිදු කරන ලද බව කොමිෂන් සභාවට නිරීක්ෂණය විය. කොමිෂන් සභාව තම තීරණය ලිඛිතව දැනුම් දුන් පසු නිලධාරිනිය අදාළ විරෝධතාවය නැවැත්විය. ඉන් පසු ඇය පරිපාලන අංශයේ රාජකාරී කිරීමට යොදවන ලද අතර, නිලධාරිනිය විසින් ලේකම් තනතුරේ රාජකාරි තාවකාලිකව ආවරණය කරන නිලධාරියකුගේ අධිකාරිය පිළිගැනීමට නොහැකි යැයි පවසමින් රාජකාරී භාර ගැනීම මුල් අවස්ථාවෙහිදි ප්‍රතික්ෂේප කළද අවවාද ලිපියක් නිකුත් කළ පසු නිලධාරිනිය තම රාජකාරීන් භාර ගෙන ඇත.

තවද, ඉහත සඳහන් කරන ලද ස්වාධීන කමිටුව විමර්ශන කටයුතු ආරම්භ කර ප්‍රකාශන සටහන් කිරීමේ කටයුතු සිදු කරමින් සිටී. එසේ තිබියදී, විමර්ශන කටයුතු සිදු වෙමින් ඇති බව නොතකමින් මෙම නිලධාරිනිය තවදුරටත් කොමිෂන් සභාවට එරෙහිව පදනම් විරහිත චෝදනා එල්ල කරමින් 2026 පෙබරවාරි 10 වන දින නැවතත් විරෝධතාවයක් දියත් කරන ලදී. මෙම නිලධාරිනිය සිවිල් සමාජ නියෝජිතයන් වෙතද ලිපි යොමු කරමින් මීට මැදිහත් වන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා ඇත. මෙම දෙවන විරෝධතාවය කොමිෂන් සභාවේ කාර්යයන් නිසිසේ පවත්වාගෙන යාමට බාධා කිරීමටත්, කොමිෂන් සභාව පිළිබඳ ඇති මහජන විශ්වාසයට හානි කිරීමටත් සිදු කරන ලද බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

මෙම තත්ත්වයන් යටතේ පුද්ගලික ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් කොමිෂන් සභාවේ කාර්යයන්ට බාධා කිරීමට හෝ කොමිෂන් සභාව පිළිබඳ මහජන විශ්වාසයට හානි කිරීමට උත්සාහ කරන ඕනෑම නිලධාරියකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා බවට කොමිෂන් සභාව මෙහිදි මහජනතාවට සහතික කර සිටි. තවද, මෙම සිදුවීම සම්බන්ධව වගකීමෙන් සහ අපක්ෂපාතීව වාර්තා කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට කොමිෂන් සභාව මාධ්‍යය වෙතින් ඉල්ලා සිටි.

සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2026.02.12